**පුරා විද්‍යාව**

# සෙල් ලිපි සන්නිවේදනය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ
සහකාර අධ්‍යක්ෂ
සිරි සමන් විජේතුංග

ලංකාවේ පැරණි සන්නිවේදන රටාව පිළිබඳ විමසා බලන විට ගිහි - පැවිදි සබඳතාව සුවිශේෂ ස්ථානයක් ලබා තිබුණු බව පැහැදිලි වන සාක්ෂි රැසක්ම හමු වී ඇත. මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කිරීම හා සම්බන්ධ වූ බුදුදහම සන්නිවේදනය කිරීමේ කාර්‍ය මහා සංඝයා වහන්සේලාට පැවරී තිබුණි. මෙම බුදුදහම සංකේන්ද්‍රණය කොට ගෙන අපේ පැරණි සන්නිවේදන රටාව කිසියම් තිව්‍ර භාවයකට පත් වූ බව ද මෙහිදී අමතක කළ යුතු කරුණක් නොවේ. මේ පිළිබඳව විමසා බලන විට මුල් කාලයේදී එනම් ක්‍රි. පූ. 3 වැනි සියවසේදී බුදුසමය මෙහි ප්‍රතිෂ්ඨාපනය වූ කාලසීමාව තුළදී අප රටේ විශේෂයෙන්ම උතුරු නැගෙනහිර හා දකුණු ප්‍රදේශවල ස්වාභාවික ගල් ලෙන් සුද්ධ පවිත්‍ර කොට ඒවා සංඝයාවහන්සේලාගේ වාසය සඳහා සකසා දීමත් ඒවා සතර දිගින් වැඩිය නොවැඩිය භික්ෂූන් වහන්සේලාට පූජා කළ බවත් අපට අද පවා සන්නිවේදනය කරන්නේ. එම ලෙන්වලින් වැසි වතුර ලෙන් තුළට කාන්දුවීම, රුරා බැසීම වැළැක්වීමට කපන ලද කටාරවලට යටින් දක්නට ඇති අක්ෂර නිසාය. මෙම අක්ෂරවලට බ්‍රාහ්මී අක්ෂර යන නාමය යොදනු ලැබේ.

ඉතාමත් කෙටිවූ මෙම අක්ෂර සහිත ලිපි ලෙන්වල ලියා ඇති නිසා ඒවා ලෙන් ලිපි ලෙසින් පුරා විද්‍යාඥයින් විසින් සලකනු ලැබේ. ඉතාමත් සලහ වචන කීපයක් නිතරම මෙම ලෙන් ලිපිවල ව්‍යවහාර වී තිබූ අන්දම අපට දැකගත හැකිය.

(1) දම ගුතහ ලෙනෙ සගස
ධම්මගුත්ත ලෙන සංඝයාට (පුදන ලදී)
(වව්නියා දිස්ත්‍රිකකයේ එරුපොතාන ලෙන් ලිපිය)

(2) උපසක දතහ ලෙනෙ.
උපාසක දත්තගේ ලෙන
(පොලොන්නරුව දිස්ත්‍රික්කයේ - දිඹුලාගල - නාමල් පොකුණ)

(3) නගතෙරෙත කපිරිනෙ චතුදිස සගස ලෙණෙ
නාග තිස්ස තෙරුන්වහන්සේ විසින් කරන ලද ලෙණ සිව්දිග සංඝයාට (පුදන ලදී)
(මොණරාගල දිස්ත්‍රික්කයේ අබේගේනවත්ත ලෙන් ලිපිය)

මේ අනුව එම ලෙන් ලිපි අප රටේ පැරණිම ලිඛිත සන්නිවේදනය ලෙසින් සැලකිය යුතුව ඇත. මෙම පැරණි ශිලා ලිපි පිළිබඳ ඉතා ගැඹුරු අධ්‍යයනයක් කළ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් පැරණි බ්‍රාහ්මී ලෙන් ලිපි 1234 අඩංගු කර ඉන්ස්ක්‍රිප්ෂන්ස් ඔෆ් සිලෝන් (Inscripitions of Ceylon) නමැති ග්‍රන්ථය 1970 දී ප්‍රසිද්ධ කරන ලදී. මෙම ශිලා ලිපි සමස්තයක් ලෙසින් ගත් කල්හි ප්‍රධාන වශයෙන් කොටස් 4 කට බෙදා දැක්විය හැකිය.

1. ලෙන් ලිපි
2. පර්වත ලිපි (ගිරි ලිපි)
3. ටැම් ලිපි
4. පුවරු ලිපි


පැරණි සන්නිවේදනයෙහිලා මෙම ශිලා ලිපිවල දායකත්වය සමකාලීනව කෙතරම් වැදගත් ස්ථානයක් දැරුවේද යන්න ඒවා පිහිටුවා ඇති ස්ථාන මෙන්ම ඒවා පිහිටුවීමට ක්‍රියා කළ ආකාරය අනුවද පැහැදිලි වනු ඇත. ලෙන් ලිපිවලින් ආරම්භ වූ ශිලා ලිපි සන්නිවේදනය පර්වතවල තවත් කල්ගත වන විට ඉතා අලංකාර ලෙසින් සැකසූ ටැම්වල ද, පුවරුවල ලියා ඇති අන්දම දැක ගත හැකිය. මේ සියල්ලෙන්ම කිසියම් සන්නිවේදනයක් සිදුකර ඇති බව සාමාන්‍යයෙන් බැලූ බැල්මට පෙනියන කරුණකි.



මන්නාරම කච්චේරි ටැම්ලිපිය

බ්‍රාහ්මී අක්ෂර මහින්දගමනයත් සමග ලංකාවේ ප්‍රචලිත වූ බව විද්වත්හු කල්පනා කරති. එහෙත් එම බ්‍රාහ්මී අක්ෂර ලිවීමේ කලාව මහින්දගමනයට සියවස් දෙක තුනකට ඉහතදී ලංකාවේ පැවති බව, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිරාන් දැරණියගල මහතා විසින් අනුරාධපුරයේ ගෙඩිගේ කැණීමකදී සොයා ගන්නා ලද වළං කැබලිවල ලියා තිබූ බ්‍රාහ්මී අක්ෂර සොයා ගැනීමෙන් පසුව තවත් මතයක් ගොඩනැගී ඇත. මේ අනුව අප රටේ ලිඛිත සන්නිවේදනය මහින්දගමනයට ඉතා ඈත කාලයක තිබූ බවට පුරාවිද්‍යාත්මක සාක්ෂියක් ලෙසින් එය ඉදිරිපත්ව සිටී. මහින්දගමනයට පූර්ව කාලයේදී ලංකාවේ ලේඛන කලාවක් පැවති බවට මහාවංසය ඇතුළු වංස කතාවල ද සඳහන් වී ඇත.

සෙල් ලිපි ආශ්‍රිතව සිදු කෙරෙන සන්නිවේදනය පිළිබඳ අප විසින් කරන ලද පර්යේෂණ මේ ගැන මෙතෙක් සිදු කර ඇති ප්‍රථම පර්යේෂණ ලෙසින් සැලකේ. අපගේ අධ්‍යයනය ඉහත සඳහන් සෙල්ලිපි වර්ග හතරෙන් ටැම්ලිපි සඳහා යොමු විය. ටැම් ලිපි අතරින්ද යම් යම් විහාරස්ථානවලට හා ආයතනවලට දෙන ලද පරිගණක හා දීමනා පිළිබඳ හා නිවේදන




ක්‍රි. ව. යට 2 වන සියවසේ බ්‍රාහ්මී අක්ෂර

තිකුත් කරන ලද වැම් ලිපි පිළිබඳ විශේෂ අවධානය යොමු කරවන ලදී.


ශිලා ලිපිවලින් සිදු කෙරෙන සන්නිවේදනය සාමාන්‍යයෙන් කොටස් දෙකක් ලෙසින් සැලකිය හැකිය.

(අ) ඍජු සන්නිවේදනය (කාලීන වශයෙන් එද සිදු කළ සන්නිවේදනය)

(ආ) වක්‍ර සන්නිවේදනය (අනාගතය සඳහා වූ සන්නිවේදනය)

## ඍජු සන්නිවේදනය

සාමාන්‍යයෙන් සන්නිවේදනය පිළිබඳ නූතන විග්‍රහය අනුව සන්නිවේදනය ලබන්නා, සන්නිවේදනය කරන්නා, පණිවුඩය යන ප්‍රධාන අංග තුන ඉතා වැදගත්ය. ඒ අනුව ලෙන් ලිපි පිළිබඳව විමසා බලන්නේ නම් එම පණිවුඩය එම ලෙන මහා සංඝයා වහන්සේලාට පූජා කළ බවය. ඇතැම්විට එම ලෙණ පූදන ලද්දේ කවුරුන් විසින්ද යන්නත් එහි සටහන් කරනු දක්නට ලැබුණි. මුල්කාලයේදී එම ලෙන් පිදීම සතර දිසාවෙන් වැඩම කළ භික්ෂූන් වහන්සේලා සඳහා සිදු කරන ලදී. චතුදිස සගස යන්නෙන් එය එම ලෙන් ලිපිවල සටහන් කර ඇත. අගත අනගත යනු පැමිණි නොපැමිණි යන අර්ථයයි. එම පූජාව සත්‍යවශයෙන්ම ඒ යුගයේ සිටි සැදැහැවතුන් විසින් සිදුකරන ලද්දකි. එම පූජාව සංඝයා වහන්සේලාට කළ බව එම ලෙන් ලිපිය මගින් කෙරෙන ඍජු සන්නිවේදනයක් ලෙසින් සැලකුව මනාය. එය කාලීන වශයෙන් සිදු කළ කාර්යයක් නිසා අප විසින් එසේ හඳුන්වනු ලැබේ. එහෙත් එය



රිටිගල වේවැල්තැන්න ගිරි ලිපිය



ඌව පළාතේ – වැලඑල්ලුගොඩ ලෙනේ ලිපියකි



උතුරු මැද පළාතේ – මහඇලගමුව ලෙනේ ලිපියකි.

අද පමණක් නොව අනාගතය සඳහාද සිදු කෙරමින් පවතින සන්නිවේදනයකි. මේ නිසා එද අපේක්ෂා නොකළ කාර්යයක් හා සේවාවක් අද එයින් සිදු කෙරේ.

## වක්‍ර සන්නිවේදනය

එම සේවාව අද වක්‍ර සන්නිවේදනය ලෙසින් හඳුන්වා දෙනු ලැබේ. එද ලෙනක් පූජා කිරීමෙන් අපේක්ෂා කළ එම සන්නිවේදනය අදට ඇත්තේ පුරාවිද්‍යාත්මක ආගමික හා ඓතිහාසික වටිනා කමකි. මේ නිසා එද අපේක්ෂිත සන්නිවේදනය ද ඉක්මවමින් අද වක්‍ර ලෙසින් එමගින් අපට පැහැදිලි කර දෙන සන්නිවේදනයක් ඇත. එය එක් අතකින් මෙම ලෙන් ක්‍රි. පූ. 3 වැනි සියවසේ පටන් ලංකාව පුරා සැකසීමෙන් එකල බුදු දහම කෙතරම් සීග්‍ර අන්දමින් ව්‍යාප්ත වූයේද යන්නට සාක්ෂියක් ද වනු ඇත. එයද මෙම ලෙන් ලිපි නිසා සිදු කෙරෙන වක්‍ර සන්නිවේදනයක් ලෙසින් සඳහන් කළ යුතුව ඇත.

මෙම ලෙන් ලිපිවල පැතිරීම පිළිබඳව පමණක් වුවද, විමසා බලන විට ඒ කාලයේදී ලංකාවේ සාක්ෂරතාව පැතිරී තිබූ ආකාරය ද මෙයින් ගම්‍යමාන වන බවද, සඳහන් කළ යුතුව ඇත. මීට අමතරව එකල ජනාවාස රටාව කෙසේ විසිරී පැවතුනේද යන්නත් මෙම ලෙන් ලිපි ආශ්‍රිතව විමසිල්ලට ලක් කළ හැකිය. භික්ෂූන් වහන්සේලාට ලෙන්වල හුදකලාවම වාසය කළ නොහේ. උන්වහන්සේලාට සිව්පසයෙන් ඇප උපස්ථාන කරන දායක දායිකාවන් ද සිටිය යුතුය. ඒ අනුව ලෙන් ආශ්‍රිතව කිසියම් ජනාවාස රටාවක්ද ඊට දුරස්ථව හෝ තිබුණාට සැක නැත. ඒවා සංඝයාවහන්සේලාගේ ගොදුරු ගම් ලෙසින් සැලකිය හැකිය.

මේ අනුව සන්නිවේදනය යන්න කිසියම් සමාජ සම්බන්ධතාවක් මත රඳ සිටිනක් බව ප්‍රත්‍යක්ෂ වේ. මිනිසුන් පමණක් නොව අනෙකුත් සතුන් ද සන්නිවේදන කාර්යයෙහි යෙදෙන බව ඉතා පැහැදිලි කරුණකි. තවද සන්නිවේදනය මිනිසුන් අතර වගේම මිනිසුන් හා සතුන් අතරද, මිනිසුන් හා වස්තූන් සමග ද සිදුවනු ඇත.

(අ) මිනිසුන් හා මිනිසුන් අතර සන්නිවේදනය

(ආ) මිනිසුන් හා සතුන් අතර සන්නිවේදනය


(ඇ) සතුන් හා සතුන් අතර සන්නිවේදනය

(ඈ) මිනිසුන් හා යන්ත්‍ර සූත්‍ර සමග කෙරෙන සන්නිවේදය (පරිගණක හා චන්ද්‍රිකා)

භාරත දේශයේ මහා අධිරාජයකු වූ අසෝක රජු විසින් ඔහුගේ රාජ්‍යය තුළ සිය බලය තහවුරු කරගැනීමට පමණක් නොව ජනතාවට අවවාද ලබාදීමට ද ශිලා ලිපි සන්නිවේදනය මැනවින් භාවිත කළ අන්දම ඉතා පැහැදිලිව දක්නට ඇත.



මුල් බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කැබලි



වෙස්සගිරියේ ගල් ලෙන්